Annual runoff at Kappachchi = 0.29 x 1.391m x 2117sq.km = 854 MCM/year

The above-calculated annual river flow at Kappachci is closer to the present annual observed river flow (from 2005 to 2016).

3.2 Feasibility study of LMR

The reservoir operations carried out for each scenario revealed that the reservoir operation with the present observed inflow data (case -f) is highly successful compared to the other scenarios with past observed inflow data. Moreover, even Yala paddy cultivation in GT and AT schemes could be increased up to 50% with a minimum irrigation success rate of 82 % while issuing 26 MCM for drinking water as in case- g (see Table 2).

Table 4*: Comparison of irrigation success rates and possible issues of drinking water*

CASE-e (1950-1975)

Scheme	Season	After LMR - Revised study (23.7 MCM)				
		Crop Type			Success	
		Paddy	OFC	Drip-fruits	Seasonal	Daily
GT	Maha	29,818			76%	93%
	Yala	8,800	8,140		80%	
AT	Maha	7,575			84%	94%
	Yala	2,200	2,080		80%	
LMR	Maha	700		1,300	60%	81%
	Yala		490		72%	
Sub total	Maha	38,093	0			
	Yala	11,000	10,710			
Total		49,093	10,710	1,300		

CASE-f (2005 -2016)

Scheme	Season	After LMR - Revised study with present data (27.0 MCM)				
		Crop Type			Success	
		Paddy	OFC	Drip-fruits	Seasonal	Daily
GT	Maha	29,818			91%	100%
	Yala	8,800	8,140		100%	
AT	Maha	7,575			100%	100%
	Yala	2,200	2,080		100%	
LMR	Maha	700		1,300	91%	98%
	Yala		490		91%	
Sub total	Maha	38,093	0			
	Yala	11,000	10,710			
Total		49,093	10,710	1,300		

4. Discussion

During the analysis of measured river flow using three different methods, even though changes in the rainfall did not support the increased river flow (method-a), the other two methods based on the CRIP study (method-b) and runoff coefficient (method -c) suggest that the increased inflow is more likely to be correct.

Consequently, increased measured river flows and the future predicted river flows facilitate the possibility of issuing requested drinking water quantity to NWSDB and the agricultural lands.

However, the reason for the drastic increase in the inflow at Kappachchi is still uncertain and it could be attributed to several underlying factors. Among these, trans-basin diversions to the Malwathu Oya basin could be one possible reason and this should be further investigated comprehensively.

When considering the CRIP's DBIP future scenarios, case 2 given in Table 2, with 428 MCM inflow per year, is the worst possible scenario from the perspective of the water issue. As the flow series available from DBIP are on a monthly scale, the present measured flow series (case-f) was adjusted to match the annual average value of 428 MCM in the reservoir operation. This method was employed to simplify the future scenario calculations and the results were summarized in the conclusion.

5. Conclusion

Due to the increase in irrigable area under both GT and AT schemes, the total irrigable area has increased by 6,713 acres, which could be cultivated successfully under the present (case-f) and future scenarios.

In conclusion, there is a possibility of issuing 27.0 MCM/year of domestic water from LMR to NWSDB with the present conditions and 26.0 MCM/year with 50% Yala cultivation in GT and AT schemes. Furthermore, even with the worst future climatic scenario (CRIP's DBIP – case 2) 25.9 MCM/year could be issued for drinking water without affecting the water issue for cultivation.

6. References

Water Resources Planning Unit, Ministry of Water Resources Management. (2013). Main Report of Lower Malwathu Oya Reservoir project (Vol. I).

Development of Basin Investment Plans (DBIP) of Malwathu Oya basin under the Climate Resilience Improvement Project (CRIP).

Bastiaanssen, W. G. M., & Chandrapala, L. (2003). Water balance variability across Sri Lanka for assessing agricultural and environmental water use. Agricultural Water Management, 58(2), 171-192.

Can a canal be an extended reservoir? An analysis of ground water flux in No-Fine Concrete Canal Lining (NFCCL) using SEEPW software

M.D.J.P.Wickramasooriya, N.Jayanthira, G.P.N.A.Pathirana

Introduction

No-Fine Concrete or permeable concrete is made with cement, water, as well as a single size of coarse aggregate to create slurry that sets up porous to use in construction. It has a comparatively low strength and is relatively light because it has a significant volume of voids.

Canals are used to convey water from one place to far away locations where water is needed. Whether the canals are in dry zone or wet zone, the commonly practiced methods are lined with natural vegetation (unlined) and lined with concrete or any other material. Canal lining using a permeable material would increase the seepage losses through the canal while enhancing the ground water level along the surrounding area of the canal. This would be indirectly helpful for the activities such as irrigated agriculture and drinking purposes of both humans and animals. It seems that adequate research studies regarding the permeable concrete were not carried out in the context of canal lining. The reason may be assumed as the engineering concept in the recent history towards the minimizing of conveyance losses.

The aim of this study is to analyse whether No-Fines Concrete Canal Lining (NFCCL) can be successfully utilized in the process of construction of lined canals to increase the ground water recharge in the shallow depths while conveying water. An assumed canal section was analysed using assumed soil properties for different permeability values of the concrete canal lining and the Water Flux (WF) in the ground variation with the distance from the canal was analysed. WF is defined as the volume of permeate produced per unit membrane area per unit time (Wenwen & Lianfa, 2005). It was found that the WF at shallow depths in the ground could be considerably improved by using NFCCL. However, still there are limitations and factors to be considered before applying NFCCL.

Methodology

Trial canal section was modelled using the computer software "SEEPW" in Geoslope software package. Model parameters were input for lined and unlined conditions maintaining the same canal parameters throughout the analysis and they are depicted in Figure 1. Isotropic condition was assumed for the soil parameters.



Figure 1: Assumed canal section and assumed soil parameters

The key variable of the model which is the permeability of the canal surface (from 1x10^{-1}ms^{-1} to 1x10^{-7}ms^{-1}) were adopted in the SEEPW model. Further, the section was analysed as a lined canal with highly impermeable concrete. The variation of the Water Flux (WF) with the distance was analysed for different permeability values of the concrete canal lining. The zero pressure point was selected at 50m distance from the edge of the base of the canal and at a depth of 7.5m from the ground level, assuming it as the ground water table at far distance from the canal.

Results



Figure 2: Analysis with concrete canal lining



Figure 3: Analysis with unlined canal

It was noticed that (Figure 2) the phreatic line goes far below the canal bed level (approximately at a depth of 7m) with the concrete canal lining with 10^{-7} ms^{-1} permeability. It is a good indication to prove that the ground water recharge does not happen due to canal lining with traditional concrete. However, the WF at different depths were analysed with NFCCL to discuss the effect on ground water due to NFCCL.



Figure 4: Variation of WF with NFCCL with different permeability values at 5m depth

From figures 4 to 6, it is clear that the water flux at a particular distance varies proportionately with the permeability of the NFCCL. It is clear that the WF gets an optimum increment around 10m distance from the canal and it becomes steady at of 20-30m distance. At each depth, a considerable drop in the WF is visible for the permeability values below the permeability range of 10^{-3}ms^{-1} to 10^{-4}ms^{-1}.



Figure 5: Variation of WF with NFCCL with different permeability values at 10m depth



Figure 6: Variation of WF with NFCCL with different permeability values at 15m depth

Discussion

It is a clear definition that the duty of a canal is to transfer water from a particular location to another location. However, this study discusses a concept of "Canal as an extended reservoir" which goes something against the concept of "Canal is to transfer of water" minimizing the conveyance losses. The research output highly complies with the theme of the World Water day 2024 - "Leveraging Water for Peace", enhancing the peace among humans, fauna & flora by sharing water which is flowing along the canal, with the fauna & flora by increasing the WF in the ground.

The main objective of the research was to study the applicability of NFCCL for the enhancement of ground water recharge along the ground beside a canal. It is obvious that the efficiency of the canal would be slightly less in this concept, however, it can be optimized by balancing the seepage loss and the beneficial gains from the ground water recharge.

This research study has to be extended towards the analysis of seepage and conveyance losses of a canal with NFCCL.

References

Wenwen Zhou & Lianfa Song (2005) 'Experimental Study of Water and Salt Fluxes through Reverse Osmosis Membranes', Environ. Sci. Technol. 2005, 39, 3382-3387, Centre for Water Research, Department of Civil Engineering, National University of Singapore, 10 Kent Ridge Crescent, Singapore 119260

2024 ලෝක ජල දිනය

වෙනුවෙන් ඉදිරිපත් කරන ලද

ලිපි හා කාව්‍ය නිර්මාණ

<u>කොචබම්බා ජල අරගලය</u>

දකුණු අමෙරිකා මහද්වීපයේ බ්‍රසීලය, පේරු හා චිලී යන රටවල් වලින් වට වූ එමෙන්ම ගොඩබිමෙන් පමණක්ම මායිම්වන රටක් ලෙස බොලිවීයාව හඳුනාගත හැකි අතර ආසන්න වශයෙන් සර්මකළාපීය දේශගුණයක් සහිත රටක් ලෙස සැළකේ. බොලීවියාව ඇමසන් වැසි වනාන්තරය, ඇටකාම කාන්තාරයද, සුප්‍රසිද්ධ අන්දීස් කඳුවැටියෙන්ද ආශ්‍රිතව පවතින රටකි. බොලීවියාව තරමක දිගු ඉතිහාසයක් සහිත රටක් ලෙස සළකන අතර පසුකාලීනව ස්පාඤ්ඤයේ යටත් විජිතයක් ලෙස පැවතිණි. අදටත් බොලීවියාවේ රාජ්‍ය භාෂාව ලෙස ස්පාඤ්ඤ භාෂාව භාවිතා වේ. බොලීවියාවේ පරිපාලන අගනුවර ලෙස ලා පාස් නගරය සළකන අතර එය ලොව වැඩිම උන්නතාංශයක් ඇති අගනුවර ලෙසද පිළිගැනේ. ඊට අමතරව සැන්ටා කෲස් නගරය බොලීවියාවේ විශාලතම නගරය ලෙස හඳුන්වන අතර කොචබම්බා යනු තවත් එක් ප්‍රධාන නගරයක් වේ. බොලීවියාව ප්‍රධාන වශයෙන් ඛනිජමය සම්පත් අතින් අනූන රටක් වන අතර ඒ නිසාම ස්පාඤ්ඤ යටත් විජිත සමයේ ඛනිජ කැණීම් හා ඛනිජ අපනයනය මත එහි ආර්ථිකය රඳා පැවතිණි.

බොලීවියානු ආර්ථික අවපාතය

ජලය හා එහි පරිභෝජනය සම්බන්ධව ඉතාමත් ප්‍රසිද්ධ රටක් බවට බොලීවියාව පත් වී ඇත. 1950 න් පසු විවිධ හමුදාමය මැදිහත්වීම් හා ගැටුම් තත්ත්ව මත බොලීවියානු ආර්ථිකය සැළකිය යුතු ලෙස කඩා වැටුණු වපසරියක් පැවතුණු අතර මේ තත්තවය වළක්වා ගැනීම පිණිස විදේශ ණය ලබාගැනීම එකම පිළිසරණ බවට පත්වී තිබිණි. ආර්ථික අවපාතයේ ප්‍රධානම ලක්ෂණ ලෙස අධික උද්ධමනය, විරැකියාව හා ජීවන තත්ත්වය දුර්වල වීම යන්න හඳුනා ගෙන තිබිණි. තත්ත්වය මෙසේ තිබීයදී නිතර ඇති වන සමාජයීය අසහනය හා දේශපාලනික අස්ථාවරත්වය මත බොලීවියානු රජයට අවසානයේ ලෝක බැංකු නිර්ණායක මත රඳා පැවතීමටත් ඒ අනුව ණය ලබාගැනීම උදෙසා කටයුතු කිරීමටත් සිදුවිණි. එම ලෝක බැංකු නිර්ණායක අතර ජලය සහ ජල භාවිතය පිළිබඳවද ප්‍රධාන කාරණා කිහිපයක් දක්නට ලැබිණි.

බොලීවියානු රජය සහ ලෝක බැංකු කොන්දේසී

බොලීවියානු රජය මුහුණ දෙමින් තිබූ ආර්ථික අවපාතය සමඟ එවකට පැවති ණය ලගාගැනීමේ ක්‍රම වේදය තවදුරටත් පවත්වා ගත යුතු නම් රජය සතු කර්මාන්ත පුද්ගලීකරණය කිරීම, පුද්ගලික ආයෝජනයන් දිරි ගැන්වීම, රාජ්‍ය සහන ලබාදීමෙන් අත්මිදීම යන මූලික කොන්දේසි ලෝක බැංකුව ප්‍රමුඛ වෙනත් විදේශ ණය ලබා දීමේ ආයතන විසින් පනවන ලදී. ඒ අනුව 1999 දී එවකට බොලිවීයානු ජනාධිපති හියුගෝ බැන්සර් බොලීවියාවේ කොචබම්බා නගරයේ ජලය පිළිබඳ සම්ප්‍රදායික භාවිතය අභියෝගයට ලක් කරමින් කොචබම්බා නගර සභාව සතු තිබූ පානීය ජල කළමණාකරණය සිදුකළ *SEMAPA(Servicio Municipal de Agua Potable y Alcantarillado)* ආයතනය පුද්ගලික අංශයට විකිණීමට ගිවිසුම් ගත විය. ඒ අනුව ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ පිහිටා තිබු *Bechtel* සමාගම විසින් කොචබම්බා නගරයේ පානීය ජලය පිළිබඳ උරුමකරුවා බවට පත් වූ අතර එම සමාගම *Aguas Del Tunari* නමින් අදාල කටයුතු ආරම්භ කරන ලදී. නව සමාගමේ ක්‍රියාකලාපයත් සමඟ එතෙක් පැවති ජල ගාස්තු 50% එකවර වැඩි වූ අතර මෙම අසාධාරණ ජල ගාස්තුව අඩුකර දෙන ලෙස කොචබම්බා නගර වැසියන් විසින් ඉල්ලීම් කළද ලෝක බැංකු නිර්ණායක මත රජය හට ආර්ථිකමය සහන ලබා දීම සිදුකළ නොහැකි විය. ඒ අනුව වැඩි වූ ජල ගාස්තු වල කිසිදු වෙනසක් සිදු නොවීය.

කොචබම්බා ජල අරගලය

කොචබම්බා නගරයේ සම්ප්‍රදායික ජල භාවිතය හදිසියේ ඇති කල පුද්ගලීකරණයත් සමඟ එහි වැසියන්ට ඇතී වූ ආර්ථිකමය පීඩනය කිසිවිටෙකත් දරාගත නොහැකි තත්ත්වයකට පත් වූ අතර 2000 වසරේදී එහි වැසියන් විශාල ප්‍රමාණයක් මීට එරෙහිව උද්ඝෝෂණ කිරීමට පෙළඹිණි. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම වූයේ *Bechtel* සමාගම සමඟ ඇතිකළ ගිවිසුම අවලංගු කර නැවතත් *SEMAPA* ආයතන වෙත ජල පද්ධතිය බාර දෙන ලෙසය. මුලදී බොලීවියානු රජය විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් යම් මර්ධනකාරී පිලිවෙතක් අනුගමය කළද දිගින් දිගටම සිදුවන උද්ඝෝෂණ නිසා මේ පිළිබඳ ලෝකය තුළ ඇති වූ කතාබහ සමඟ අවසානයේදී සමාගම සමඟ ඇතිකළ ගිවිසුම අවලංගු කිරීමට බොලීවියානු රජයට සිදුවිය.

මෙම දැවැන්ත අරගලයත් සමඟ කොචබම්බා නගරයේ ජල සම්පත පුද්ගලීකරණය නිසා ඇති වූ සමාජ අසහනය හා ව්‍යාකුල තත්ත්වය යම් පමණකට පාලනය වුවද වර්තමානය වන විටත් දේශගුණික විපර්යාස සමඟ ඇති වන බලපෑම් හමුවේ සහ ජනගහන වර්ධනය සමඟ ඇති ජල ඉල්ලුම පිරිමසා ගැනීමේ අර්බුදය තවමත් බොලීවියාව මුහුණ දෙමින් පවතින ප්‍රධාන ගැටලුව වේ.

කෙසේ වෙතත් රටක ස්වභාවික ජල මූලශ්‍ර හා ඒවා පිළිබඳ එම රට තුළ පවතින සම්ප්‍රාදායික භාවිතයන් හා විශ්වාසයන් පසෙකලා හුදෙක් ආර්ථිකමය අවශ්‍යාතා වෙනුවෙන් විදේශ න්‍යාය පත්‍රයන්ට යටත්ව කටයුතු කිරීම පවතින ගැටලුව තවත් උග්‍ර කිරීමක් මිස විසඳුමක් නොවන බවට කොචබම්බා ජල අරගලය ලෝකයට කියා දෙන පාඩමකි. ඒ අනුව රටක ජල ප්‍රතිපත්තිය වනාහි එම රට මුහුණ දෙන ආර්ථිකමය කාරණා පමණක් සැළකිල්ලට ගෙන සකස් කළ යුතු දෙයක් නොව, සංස්කෘතික හා ඓතිහාසික භාවිතයන්ද එකසේ සැළකිල්ලට ගෙන සකස් විය යුතු බවට නිගමනය කිරීම වඩාත් සාධාරණය.

ඉංජී. ආර්.ඒ.ආර්.වී.ක්‍රිෂාන්ත
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු
ගම්පහ

ජල කළමනාකරණයට භූගෝලීය තොරතුරු තාක්ෂණය යොදා ගැනීම

එදා සහ අද

ලෝකයේ බොහෝ රටවල ශිෂ්ඨාචාර ගංගා නිම්න ආශ්‍රිතව ඇති වූ බැවින් ජල කළමනාකරණය ද ඒ ආශ්‍රිතව වර්ධනය විය. ආසියානු කලාපය පිළිබඳ සළකා බැලීමේදී එක් එක් පාලකවරු යටතේ විවිධ සංවර්ධන ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව පැහැදිලි වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ද රාජධානි කේන්ද්‍රගත කර ගනිමින් වාරි ශිෂ්ඨාචාර බිහි වී තිබේ. අහසෙන් වැටෙන එක දිය බිඳක් හෝ මුහුදට ගාලා යා නොදී වැව් තනා කෙත්වත් සරු කෙරූ රජවරු එකළ අප රට තුළ වුහ. මේ නිසා ජල කළමනාකරණය එදා සිටම ලංකාව තුළ පැවත ඇත. නමුත් ජන සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩි වීමත් සමඟ එදා තිබූ ජල කළමනාකරණයේ විධිමත් බවක් ඇති කිරීමට වතර්මානය වන විට අවශ්‍යව ඇත. මේ නිසා අද වන විට භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ජල කළමනාකරණයට නැතිවම බැරි මෙවලමක් වී හමාරය. මෙම භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ලෝකයට පැමිණෙන්නේ 1960 වෂර්යේදීය. ඒ වන විට පරිගණක ඇතුළු උපාංගවල ඇති දියුණුවත්, සිතියම්කරණයේ ඇති අවශ්‍යතාව හා දියුණුවත් හේතුවෙන් GIS නැතහොත් භූගෝලීය තොරතුරු පද්ධතිය ඉතාමත් වේගයෙන් ප්‍රචලිත වෙමින් පැවතුණි. භූගෝලීය තොරතුරු පද්ධතියේ අවශ්‍යතාව වැඩි වශයෙන් සමාජයට දැනීම ආරම්භ වුයේ 1845දී එංගලන්තයේ ලන්ඩන් නගරය තුළ කොළරාව රෝගය වසංගත තත්ත්වයට පත්වීමත් සමඟ ජෝන් ස්නෝ කොළරාවට ගොදුරු වුණු පිරිස් සිටින ස්ථාන කඩදාසියක සටහන් කර රෝගීන් වැඩිපුර ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ ජල මාගර් ආශ්‍රිතවබව සොයා ගැනීමෙන් අනතුරුවය. මෙයින් අවකාශීය විශ්ලේෂණයේ (Spatial Analysis) වැදගත්කම වැඩි වූ අතර එයින් වෙනත් අංශ සඳහාද භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) යොදා ගන්නා ලදී.

භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) පැමිණීමට පෙර ජල කළමනාකරණය සඳහා පහත දැක්වෙන ක්‍රම ශිල්ප යොදා ගෙන තිබේ.

- **කඩදාසි සිතියම් (Paper Maps)**

මෙහිදී නිලධාරීන් ගංගා, විල් සහ ජලධර (Aquifers) වැනි ජල සම්පත් දෘශ්‍යමාන කිරීම සඳහා කඩදාසි සිතියම් යොදා ගන්නා ලදී. මෙම සිතියම් බොහෝ විට සමීක්ෂණ සහ ක්ෂේත්‍ර මිනුම් මත පදනම්ව අතින් සාදන ලද්දකි.

- **මිණුම් (Manual Surveys)**

මෙම ක්‍රමයේදී මිනින්දෝරුවන් ප්‍රමාණය, ගැඹුර, ප්‍රවාහ අනුපාතය සහ ගුණාත්මකභාවය ඇතුළුව ජල මූලාශ්‍ර (Water Bodies) පිළිබඳ දත්ත රැස්කරනු ලබන අතර මෙම දත්ත පසුව කඩදාසි සිතියම් මත සලකුණු කරනු ලබයි.

- **ගුවන් ඡායාරූප (Aerial Photography)**

මතුපිට ගලා යන ජල ධාරා (ගංගා සහ ඔය) භූ විෂමතා අනුව, කාලයත් සමඟ වෙනස්වීම හඳුනා ගැනීමට යොදා ගන්නා ලද්දේ ගුවන් ඡායාරූපයි. මෙහිදී ජල මූලාශ්‍ර ඇතුළු භූ දශර්නවල ගුවන් ඡායාරූප විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලදී.

- **ක්ෂේත්‍ර මිනුම් (Field Measurements)**

ජල කළමනාකරණ නිලධාරීන් බොහෝවිට ප්‍රවාහ මීටර (Flow Meters), ජල මට්ටම් සටහන් කිරීම් (Water Level Records) සහ ජල තත්ත්ව සංවේදක (Water Quality Sensors) වැනි උපකරණ භාවිතයෙන් ක්ෂේත්‍ර මිනුම් සිදු කර ඇත. මෙහිදී මිනුම් අතින් සටහන් කර විශ්ලේෂණය කරන ලදී.

- **අතිච්ඡාදන/ ආවරණ විශ්ලේෂණය (Overlay Analysis)**

අතින් සිදු කළද අතිච්ඡාදන/ ආවරණ විශ්ලේෂණය එකළ භාවිත කරන ලද විශ්ලේෂණ ක්‍රමයක් වේ. එහිදී විවිධ ජලය ආශ්‍රිත සාධක එනම් උදාහරණ ලෙස ජල පෝෂක, මායිම්, පාංශු වගර්, ඉඩම් පරිහරණය වැනි ස්ථර එක මත එක පිහිටන ලෙස සිතියම් සම්බන්ධතා සහ රටා හඳුනා ගැනීම සඳහා මෙම ක්‍රමය යොදාගෙන ඇත.

- **අතින් කරන ලද ගණනය කිරීම් (Manual Calculations)**

මෙහිදී ජල ප්‍රවාහය (Water Flow), මතුපිට ගලා යාම (Runoff) සහ ජල විද්‍යාත්මක ආකෘති (Hydrological Modeling) නිමර්ාණය සම්බන්ධ ගණනය කිරීම් අතින් හෝ මූලික ගණක යන්ත්‍ර මඟින් සිදු කරන ලදී. මෙම ගණනයන් සඳහා බොහෝවිට ශ්‍රමය දැඩි ලෙස යෙදවීමට අවශ්‍ය වුවද දෝෂවලට ලක්වීමේ ප්‍රවණතාවය වැඩි විය.

- **අතින් අඳින ලද ජල විද්‍යාත්මක ආකෘති (Hand – Drawn Hydrological Models)**

ජල විද්‍යාඥයින් ජල පෝෂක (Watershed) තේරුම් ගැනීමට, ගංවතුර පුරෝකථනය කිරීමට සහ ජලය ලබා ගැනීමේ හැකියාව තක්සේරු කිරීමට ජල පෝෂක සහ ගංගා ද්‍රෝණි අතින් අඳින ලද ආකෘති නිමර්ාණය කිරීමට භාවිත කරන ලදී.

- **අතින් කරන ලද දත්ත කළමනාකරණය (Manual Data Management)**

වෂර්ාපතනය, ධාරා ප්‍රවාහය (Stream Flow) සහ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ ඓතිහාසික වාතර්ා ඇතුළු ජලය සම්බන්ධ දත්ත එකළ කඩදාසි මත පදනම් වූ පද්ධති භාවිතයෙන් අතින් කළමනාකරණය කරන ලදී. මෙම ශිල්ප ක්‍රම යම් ප්‍රමාණයකට ඵලදායී වුවද ඒවා ශ්‍රමය, කාලය වැඩි වශයෙන් වැයවෙන දෝෂ සහිත වූ බැවින් GIS පැමිණීම දත්ත එකතු කිරීම, විශ්ලේෂණය, දෘෂ්‍යකරණය සහ තීරණ ගැනීම සඳහා කාර්යක්ෂම මෙවලමක් බවට ඉතා කෙටි කාලයක් තුළදී පත්විය.

එහි ප්‍රතිඵලයක් ලෙස අද වන විට ජල කළමනාකරණයේ විප්ලවීය වෙනසක් සිදු වී තිබේ. ඒ අනුව ජල කළමනාකරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) යොදා ගැනීම ආකාර කිහිපයකින් සිදු කරයි. එනම්,

- **ජල මුලාශ්‍ර සිතියම්ගත කිරීම සහ විශ්ලේෂණය (Mapping and Analysis of Water Sources)**

මෙහිදී GIS මඟින් ජල මුලාශ්‍ර කාර්යක්ෂමව සිතියම් ගත කිරීමට සහ විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබේ. එය දැනට පවතින ජල මුලාශ්‍ර, විභව මුලාශ්‍ර සහ ඒවායේ අවකාශීය ව්‍යාප්තිය හඳුනා ගැනීමට උපකාරී වේ. එමෙන්ම සිතියම් මත ජල මුලාශ්‍ර දෘශ්‍යමාන කිරීම තීරණ ගැනීමට, ජල සැපයුම, බෙදා හැරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ.

- **ජල තත්ත්ව අධික්ෂණය (Water Quality Monitoring)**

ජලයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම මිනිස් පරිභෝජනයට සහ ජලජ පරිසර පද්ධති සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. GIS මඟින් ජලයේ බොර බව, PH අගය සහ දූෂක මට්ටම් වැනි ජල තත්ත්ව පරාමිතීන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමට ඉඩ සලසයි. එමෙන්ම අවකාශීය රටා විශ්ලේෂණය කිරීමෙන් ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට බලධාරීන්ට නිවැරදි පියවරවල් කාර්යක්ෂමව ගැනීමට ද මඟ පාදයි.

- **ගංවතුර පිළිබඳ අනාවැකි සහ කළමනාකරණය (Flood Prediction and Management)**

මෙහිදී ගංවතුර ආකෘති නිමර්ාණය, අවදානම් තක්සේරු කිරීම සහ පූවර් අනතුරු ඇඟවීමේ පද්ධති සඳහා GIS යොදා ගැනීමට හැකියාව තිබේ.

භූ ලක්ෂණ දත්ත, ඉඩම් පරිහරණය සහ ජල විද්‍යාත්මක තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් ගංවතුර හේතුවෙන් අවදානම් ප්‍රදේශ පුරෝකථනය කිරීමට හැකියාව පවතී. එමෙන්ම නිවැරදි ගංවතුර සිතියම් (Flood Map) මඟින් හදිසි ප්‍රතිචාර එලදායීව සැලසුම් කිරීමටද හැකියාව පවතී.

- **නියඟ කළමනාකරණය (Drought Management)**

නියඟ කාලවලදී ජල හිඟය තක්සේරු කිරීමට, අවධානමට ලක්විය හැකි ප්‍රදේශ හඳුනා ගැනීමට සහ ජලය වෙන් කිරීම කළමනාකරණය කිරීමට GIS යොදාගත හැකිය. එය ජලය බෙදා හැරීම ප්‍රශස්ත කිරීමට, ජල භාවිතයට ප්‍රමුඛත්වය දීමට සහ විකල්ප ජල මූලාශ්‍ර සඳහා සැලසුම් කිරීමට උපකාර වේ.

- **ජල සංරක්ෂණය සහ භාවිත කායර්ක්ෂමතාව (Water Conservation and Usage Efficiency)**

ඉල්ලුම, සැපයුම සහ පරිභෝජන රටාවන් විශ්ලේෂණය කිරීම මඟින් කායර්ක්ෂමව ජල සම්පත් වෙන් කිරීම සඳහා GIS දායක වේ. ප්‍රශස්ත ජල බෙදා හැරීම සඳහා ජාල සැලසුම් කිරීම, දුවර්ලතාවයන් අවම කිරීම සහ තිරසාර ජල භාවිතය ප්‍රවධර්නය කිරීම සඳහා GIS දායක වේ.

මේ අනුව භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) මඟින් ස්වාභාවික ව්‍යවසනයන්ගෙන් ආරක්ෂා වීමට ප්‍රජාවන් සහ පරිසර පද්ධති සඳහා විශ්වසනීය සහ නිවැරදි දත්ත ලබා දෙන අතරම ජල සම්පත් පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය නිවැරදි මඟ පෙන්වීම මෙන්ම දැනුවත් කිරීම මේ පිළිබඳ තීන්දු තීරණ ගන්නා නිලධාරීන් හට ඉතා කෙටි කාලයක් තුළදී ලබාදීම සිදුවේ.

වතර්මානය වන විට ජන සංඛ්‍යාවේ වධර්නය හා ශීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් ජලයද සීමිත සම්පතක් බවට පත් වී හමාරය. එබැවින් නුපන් දරු පරපුරට යහපත් මෙන්ම සුවදායී ලෝකයක් දායාද කිරීමට මෙවැනි නවීන තාක්ෂණ මෙවලම් වැඩි වශයෙන් භාවිත කරමින් ජල කළමනාකරණය කිරීම ඉතාමත් කාලෝචිත වේ. එයට හේතුව වනුයේ සමාජයක මූලික අවශ්‍යතාවයක් වන ජලය සියල්ලන්ටම ලබා දීම සාධාරණ සමාජයක් පවත්වාගෙන යාමට ඉවහල් වන බැවිනි.

විමශර්න මූලාශ්‍ර

Esri. (2012). History of GIS. Esri: https://www.esri.com/en-us/what-is-gis/history-of-gis වෙතින් ලැබුණි

Irrigation Department. (n.d.). GIS Applications. Irrigation Department: https://slirrigation.maps.arcgis.com/home/index.html වෙතින් ලැබුණි

Oseke, Anornu, Adjei, K., & Eduvie, M. (2021). Assessment of water quality using GIS techniques and water quality index in reservoirs affected by water diversion. ScienceDirect, 25-34.

Roar Media. (2017 November මස 17 වැනිදා). තිරය පිටුපස සිට ලොකු වැඩ කොටසක් කරන GIS ගැන දැන ගනිමු. Roar Media: https://roar.media/sinhala/main/science-tech/gis වෙතින් ලැබුණි

Yahya, B., Salih, A., & Ahmed, K. (2023). Water Resources Management and Applications using GIS: An Overview. ResearchGate, 65-73.

රචනය :

කේ.එම්. මහේෂි මධුභාෂිණී කුලතුංග (සංවර්ධන නිලධාරී)

සංස්කරණය:

ඉංජි. එම්.ඒ.ඩී.එන්. ආරියසේන (භූ සම්පත් ඉංජිනේරු)

ජලය හා බැඳුණු නීති සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී මෑත කාලීන ඉතිහාසයෙන් උගත හැකි පාඩම් කිහිපයක්

ශ්‍රී ලංකාව ජල සම්පතින් පොහොසත්, ජලය හා බැඳුණු දීර්ඝ ඉතිහාසයක් සහිත රටකි. වසර දහස් ගණනක දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන එහි, ජලයට සහ ජලය පරිහරණයට අදාළ ලිඛිත සහ අලිඛිත නීති/ සම්ප්‍රදායන් මෙරට පවතින අතර, වර්තමානයේ පවතින නීත සහ පරිචයන් එම සංස්කෘතික පදනම මත සකස් වී ඇත. මෙරට පාලනය කළ විදේශිකයින් පවා නීති සකස් කිරීමේදී එතෙක් මෙරට පැවති සම්ප්‍රදායන් සැලකිල්ලට ගත් බවට හොඳම නිදසුනක් ලෙස 1856 දී ප්‍රථම වාරිමාර්ග ආඥාපනත සකස් වීම ගත හැකි ය. ජල භාවිතයේ සිදුවන කාලානුරූපී වෙනස්කම් අනුව ජල සම්පත් ක්ෂේත්‍රයේ නීති සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය කර සුදුසු වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වුව ද, පසුගිය වසර පනහක පමණ ඉතිහාසය තුළ එම ක්ෂේත්‍රයෙහි නීති/ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ උත්සාහයන් කිහිපයක් ම අසාර්ථක වී ඇති බව ද පෙනී යයි. මෙම අසාර්ථක වීම් සඳහා විවිධ හේතු බලපා ඇති බව නිරීක්ෂණය වන අතර, ජලය සම්බන්ධයෙන් ඉදිරි ප්‍රතිපත්ති/ නීති සැකසීමේදී මෙම හේතු සබුද්ධිකව විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව නොකිව මනා ය. එබැවින් 1970 දශකයේ සිට මේ දක්වා ජලය සම්බන්ධව ඉදිරිපත් කරන ලද, එහෙත් ක්‍රියාත්මක කිරීම අසාර්ථක වූ පහත සඳහන් පනත් කෙටුම්පත් සහ ප්‍රතිපත්ති ගැන මෙම ලිපිය මගින් විමසා බැලේ.

පනත් කෙටුම්පත/ ප්‍රතිපත්තිය	වර්ෂය
ජල සම්පත් පනත් කෙටුම්පත	1979
ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සහ ආයතනික සැකැස්ම	2000
ජාතික ජල සම්පත් පනත් කෙටුම්පත	2003
ජල සේවා ප්‍රතිසංස්කරණ පනත් කෙටුම්පත	2003

ජාතික ජල සම්පත් පනත් කෙටුම්පත (1979)

ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිත ආයතනයේ (USAID) මූල්‍ය ප්‍රතිපාදන මත ජාත්‍යන්තර නීති උපදේශකවරයෙකු විසින් මෙම පනත් කෙටුම්පත සකස් කරන ලදී. එම උපදේශකවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, ඔහු මූලික කෙටුම්පතක් ද සමග 1979 වර්ෂයේ දී මෙරටට පැමිණ ඇති අතර, එහි දී සති හතරක කාලයක් තුළ මෙරට අදාළ පාර්ශව හමුවී සාකච්ඡා කිරීමෙන් අනතුරුව පනතෙහි අවසන් කෙටුම්පත සකස් කර ඇත. මෙම පනත ක්‍රියාත්මක වීමේ දී ජල සම්පත් ක්ෂේත්‍රයට අදාළ වෙනත් පනත් (විශේෂයෙන් වාරිමාර්ග ආඥාපනත සහ ජල සම්පත් මණ්ඩල පනත) සංශෝධනය (revise)/ අහෝසි කිරීම (repeal)/ නැවත බල ගැන්වීම (re-enact) සිදු කළ යුතු බව එම වාර්තාවෙහි සඳහන් වෙයි. ජලයෙහි භාවිතය සහ අයිතිය (ජලයෙහි අයිතිය සහ පාලනය රජය වෙත ලබා දීම), ජල පරිපාලනය, ජල විභාජනය (water allocation), ජල කළමනාකරණය, ජල මිල ගණන්, ජල අධිකරණ යනාදී අංශ ඇතුළත් මෙම පනත් කෙටුම්පත එවකට දේශපාලන අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එකළ මෙරට ප්‍රධානතම සංවර්ධන ව්‍යාපෘතිය වූ මහවැලි සංවර්ධන වැඩසටහන සඳහා මෙම පනත මගින් බාධකයක් ඇතිවිය හැකිය යන හැඟීම ද ඊට හේතු වී ඇති බව කියනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ජල සම්පත් ක්ෂේත්‍රයට සහ ඊට අදාළ නීති පද්ධතියට සම්පූර්ණයෙන් ම ආගන්තුක වූ සංකල්ප මෙම කෙටුම්පත තුළ අන්තර්ගත වීමත්, එම සංකල්ප අන්තර්ගත ප්‍රතිපත්ති ලේඛන සහ පනත් කෙටුම්පත් පසුකාලීනව ද වරින් වර ඉදිරිපත් වීමත් යන හේතු නිසා ඒ පිළිබඳව ද සැකෙවින් සලකා බැලීම වටී. මෙමගින් හඳුන්වා දී ඇති ජලයෙහි අයිතිය රජය වෙත ලබා දීමේ සංකල්පය මෙරට නීති පද්ධතිට මුලුමනින් ම ආගන්තුක බව මෙහි දී පෙන්වා දිය යුතු ය. මීට අමරතව මෙම පනත් කෙටුම්පත මගින් දී ශ්‍රී ලංකාවට ආගන්තුක "ජල හිමිකම්" (Water Rights) නම් සංකල්පය හඳුන්වා දෙනු ලබන අතර, ජලය පරිහරණය කරන්නන් සඳහා බලපත්‍රයක් (Permit) ලෙස එම හිමිකම නිකුත් කිරීමත් යෝජනා කරන ලදී. ඊට අමතරව මෙම බලපත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුලු

කාර්යයන් කිහිපයක් සඳහා ජල සම්පත් සභාව (Water Resources Council), ජල සම්පත් ලේකම් කාර්යාලය (Water Resources Secretariat) සහ ජල අධිකරණය (Water Courts) යන තුන් ඇඳුතු ආයතනික ව්‍යුහයක් ද එමගින් යෝජනා කරන ලදී. බලපත්‍ර නිකුත්කිරීම සඳහා අනුමැතිය ලබාදීම සහ බලපත්‍ර සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් විසඳීම යන කාර්යයන් මෙම ආයතනයන්ට අදාළ බව පනත් කෙටුම්පතෙහි සඳහන් වේ.

ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සහ ආයතනික සැකැස්ම (2000)

ආසියානු සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙත ලබා දෙන ලද විස්තීරණ ජල සම්පත් කළමනාකරණය සඳහා වූ ආයතනික සවිබල ගැන්වීම (Institutional Strengthening for Comprehensive Water Resource Management) යන තාක්ෂණික සහාය (Technical Assistance) වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ජල සම්පත් සභාව (National Water Resources Council), ජාතික ජල සම්පත් අධිකාරිය (National Water Resources Authority) සහ ජල සම්පත් විනිශ්චය සභාව (Water Resources Tribunal) යන තුන් ඇඳුතු ආයතනික ව්‍යුහය, අන්තර් කාලීනව 1996 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. මෙකී ආයතනික ව්‍යුහය 1979 වර්ෂයේ දී ජල සම්පත් පනත් කෙටුම්පත මගින් හඳුන්වා දෙන ලද ආයතනික ව්‍යුහයට සමාන බව ඒවායේ අරමුණු සහ කාර්යභාරයන් අධ්‍යයනයේදී පෙනී යයි. 2000 වර්ෂයේ දී ජාතික ජල සම්පත් අධිකාරිය විසින් කෙටුම්පත් කරන ලද ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සහ ආයතනික සැකැස්ම යන ලේඛනය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර, එහි මූලික අරමුණ ද ජල හිමිකම් නමැති සංකල්පය මෙරට ස්ථාපනය කිරීම බව එම ලේඛණය අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ. තව ද, 1979 පනත් කෙටුම්පතෙහි සඳහන් වූ ආකාරයටම, මෙරට මතුපිට සහ භූගත ජලයේ අයිතිය රජය සතු වන බව මෙම ප්‍රතිපත්ති ලේඛනයේ ද සඳහන් කර ඇත. ජලය සඳහා හිමිකමක් Water Entitlement ලෙස ලබා දීමට මෙහි දී යෝජනා කර ඇති අතර, එම හිමිකම වෙනත් පාර්ශවයක් වෙත පැවරීමට අවකාශ ලබා දීම හරහා ජල සංරක්ෂණය සහ වඩා හොඳ ජල විභාජනයක් (water allocation) ප්‍රවර්ධනය කළ හැකි බව එහි සඳහන් වේ. අනතුරුව ජල හිමිකම් සංකල්පය සහ එම ලේඛනයෙහි ඇතුළත් වෙනත් කරුණු පාදක කරගනිමින් ප්‍රතිපත්තියට විරුද්ධව විශාල ප්‍රතිරෝධයක් රට තුළ උද්ගත වූ අතර, අදාළ පාර්ශවකරුවන් සමඟ නිසි සන්නිවේදනයකින් තොරව සහ රටේ සංස්කෘතික සහ නීතිමය පසුබිම ගැන නිසි අවබෝධයකින් තොරව මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇති බවට ද චෝදනා එල්ල විය. එසේම, මේ සම්බන්ධයෙන් ඇති වූ ඇතැම් විරෝධතා දේශපාලන මුහුණුවරක් ද ගන්නා ලදී. මේ සියලු කාරණා මධ්‍යයේ 2002 වර්ෂයේ දී සිදුවූ ආණ්ඩු පෙරළියත් සමග මෙම ලේඛනය සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කිරීම ඇනහිටින.

ජාතික ජල සම්පත් පනත් කෙටුම්පත (2003)

2000 වර්ෂයේදී ගෙන එන ලද ප්‍රතිපත්ති ලේඛනය ඉදිරියට ක්‍රියාත්මක නොවූව ද, ඒ වන විටත් අන්තර් කාලීනව පිහිටුවා තිබූ ආයතනික ව්‍යුහය සඳහා නෛතික පදනමක් ලබා දී ස්ථිරව පිහිටුවීමට නම්, ඒ සඳහා සඳහා පාර්ලිමේන්තු පනතක් ගෙන ඒම අත්‍යවශ්‍ය කරුණක් විය. එබැවින් අන්තර්කාලීනව පිහිටුවා තිබූ ජාතික ජල සම්පත් අධිකාරිය විසින් 2003 වර්ෂයේ දී ජල සම්පත් පනත් කෙටුම්පතක් සකස් කරන ලදී. එහෙත් 2004 වර්ෂයේ වර්ෂයේදී පත්වන නව රජය විසින් අන්තර් කාලීනව පිහිටවන ලද උක්ත ආයතනික ව්‍යුහය අහෝසි කිරීමට කටයුතු කිරීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් ද ඉදිරි කටයුතු සිදු කිරීම වැළකින.

ජල සේවා ප්‍රතිසංස්කරණ පනත් කෙටුම්පත (2003)

ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සහ ජාතික ජල සම්පත් පනත් කෙටුම්පත සමග සෘජු සම්බන්ධයක් නොමැති බව බැලූ බැල්මට පෙනී ගිය ද, එමඟින් ස්ථාපනය කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය පසුබිම මෙම පනත් කෙටුම්පත තුළ ද දක්නට ලැබෙන බවත්, ජලය වෙළඳ භාණ්ඩයක් බවට පත්කිරීමේ උත්සාහයක් මෙම පනත හරහා ක්‍රියාත්මක වූ බවත් පසු කාලීනව මේ සම්බන්ධයෙන් අධ්‍යයනය

කරන ලද පර්යේෂකයින් විසින් පෙන්වා දී ඇත. මේ හේතුවෙන් මෙම පනත් කෙටුම්පත සඳහා සමාජයෙන් එල්ල වූ ප්‍රතිවිරෝධයෙහි වඩාත් තීව්‍ර බවක් පෙනෙන්නට තිබුණි. මේ සම්බන්ධයෙන් වන වැදගත්ම කරුණ වන්නේ මෙම පනත් කෙටුම්පත රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කිරීම යි. මෙම තීන්දුවත් සමග මෙම කෙටුම්පත ද ඉදිරියට ක්‍රියාත්මක වීම වැලකුනි.

උගත හැකි පාඩම්

මෙම බොහොමයක් ප්‍රතිපත්ති සහ පනත් කෙටුම්පත් කිරීම විදේශීය ණය ව්‍යාපෘතීන් යටතේ සිදුකර ඇති අතර, ඒවා අසාර්ථක වීම මත ඒ සඳහා වැය කළ මුදලින් නිසි ප්‍රතිඵලයක් ලැබී නොමැති බව පෙනී යයි. මෙම ක්‍රියාවලින් පිළිබඳ මහජනතාව, මහජන නියෝජිතයින්, රාජ්‍ය ආයතන ඇතුළු පාර්ශ්වකරුවන් නිසි පරිදි දැනුවත් නොකිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් විවිධ ප්‍රතිවිරෝධතා මතුවී ඇති බව නිගමනය කළ හැකිය. නීති සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී ඊට දායක වීමට මහජනයාට නිසි අවස්ථාවක් සලසා නොදීම මෙම සිද්ධීන් අධ්‍යයනයේදී කැපී පෙනෙන ප්‍රධාන නිරීක්ෂණයකි.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඇති පර්යේෂකයින් පෙන්වා දෙන ප්‍රමුඛ කරුණක් නම් මේ සෑම සිද්ධියක් මගින් ම පෙන්නුම් කරන්නේ, මේ රටට ආගන්තුක සංකල්ප මෙරට ස්ථාපනය කිරීමට බොහොමයක් ණය දෙන ජාත්‍යන්තර මූල්‍යායතන විසින් දරන ලද උත්සාහයන් බව ය. ජල සේවා ප්‍රතිසංස්කරණ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කිරීම හරහා පෙනී යන වැදගත් කාරණය වන්නේ පනත් කෙටුම්පතක් සැකසීමේදී මූලිකව සලකා බැලිය යුතු කරුණු පවා එහිදී මග හැරී ඇති බවකි.

එබැවින් අනාගත ප්‍රතිපත්ති සහ නීති සම්පාදනයේ දී අප විසින් අත්‍යවශ්‍යයෙන් ම සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පහත පරිදි ගොණු කළ හැකි ය. මෙම පනත් කෙටුම්පත්/ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මහජන විරෝධතා ඇතිවීමට හේතු කවරේ ද යන්නත්, එම විරෝධතා තුළ සාධාරණ හේතු ගැබ්ව තිබේ ද යන්නත්, එසේ නම් ඒවා නීති/ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සාධනීය ලෙස අන්තර්ගත කර ගන්නේ කෙසේ ද යන්නත් අප සලකා බැලිය යුතු ය. එම විරෝධතා ඇතිවන්නේ වැරදි අවබෝධයක් නිසා නම් ඒවා මහජනතාව වෙත පැහැදිලි කර දීමේ උපායමාර්ගික සැලැස්මක් සකස් කර ගැනීම මෙවැනි කාර්යයකදී අත්‍යවශ්‍ය කරුණකි. එසේ ම විවිධ ක්ෂේත්‍රයන් සඳහා බලපානු ලබන ප්‍රතිපත්ති සහ නීති සම්පාදනයේ දී ඒවා අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගැනීම සහ ඒවා මෙරට පවතින නීතිය සමග අනනුකූල (inconsistent) නොවන අයුරින් සකස් කර ගැනීම ද ඉතා වැදගත් බව නොකිව මනාය. මෙම අතීත සිදුවීම් දෙස විචාරශීලීව නොබැලීම හරහා සිදුවන්නේ මහජන මුදල් නාස්තියක් පමණක් නොව අනවශ්‍ය ගැටලු නිර්මාණය වීමක් ද බව මෙහි දී විශේෂයෙන් අවධාරණය කළ යුතුය. තවද මෙරට සංස්කෘතික සහ පවතින නීතිමය පසුබිම පිළිබඳ නිසි අවබෝධයකින් තොරව මෙරටට ආගන්තුක සංකල්ප මත එල්බගෙන ඒ මත පදනම්ව නීති/ ප්‍රතිපත්ති සම්පාදනයට උත්සාහ දැරීම මගින් සිදුවන වඩාත් අහිතකර තත්ත්වය නම් රටට ගැලපෙන ජාතික ප්‍රතිපත්ති හා නීති සම්පාදනයට ඇති සාධනීය ඉඩ-කඩ ඇහිරී යම බව අප තේරුම් ගත යුතු ය.

ඉංජි. දුලන්ජන් විජේසිංහ
වාරිමාර්ග ඉංජිනේරු, ජලශක්ති පර්යේෂණාගාරය

බැරැක්ප්ලේන් වටා එක් වූ පාර්ශවකරුවෝ........

හැඳින්වීම

2024 ලෝක ජලය දිනය නිමිත්තෙන් "සාමය සඳහා ජලය භාවිතා කිරීම" තේමා කරගනිමින් පැවැත්වෙන ලෝක ජල දින සැමරුම සඳහා පාර්ශවකරුවන්ගේ හවුල්කාරිත්වය සහ ජල අංශයේ නීතිමය පසුබිම යන මාතෘකාවන්ට සුදුසු උදාහරණයක් ලෙස බැරැක්ප්ලේන් වැව සංවර්ධන කාර්යය පහත පරිදි පෙන්වා දිය හැකිය.

පිදුරුතලාගල කන්දෙන් ආරම්භ වන බැරැක්ප්ලේන් පෝෂක ඇල, විශාල සංචාරක ආකර්ෂණයක් ඇති සුන්දර නුවරඑළිය පුරවරය සරසවමින් උමා ඔය ඔස්සේ මහවැලි ගඟ දක්වා දියවර සපයනු ලබයි. නුවරඑළියට ඇති ප්‍රධාන ජල මූලාශ්‍රය වන මෙම ජල දහර ආරම්භයේදීම ලවර්ස්ලීප් (Lovers' leap) නම් වූ සුන්දර දිය ඇල්ලකින් හැඩගන්වනු ලබයි. එය දෙස් විදෙස් සංචාරකයන්ගේ ප්‍රධාන නැරඹුම් ස්ථානයකි. බැරැක්ප්ලේන් වැවට ජලය සපයනු ලබන ප්‍රධාන පෝෂක ඇල මෙය වන අතර බැරැක්ප්ලේන් වැව, 1885 දී එවකට රට පාලනය කල බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉදිකරන ලද්දකි. මෙම වැව ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ වූයේ වැව්ලි ප්‍රජාවගේ විනෝදාස්වාදය සඳහා වේ.

බෝඹුරු ඇල්ල බහුකාර්ය ජලාශය ඉදිකිරීමත් සමඟ එම යෝජනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණු ලගා කරගැනීම සඳහා බැරැක්ප්ලේන් වැව අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. ඒ අනුව බැරැක්ප්ලේන් වැවට පහලින් ඉදිකර ඇති බෝඹුරු ඇල්ල ජලාශය මගින් පෝෂණය වන උමා ඇල ව්‍යාපාරයෙහි අක්කර 2005 ක් සඳහා වාරි ජලය සපයනු ලබන අතර, යල කන්නයේදී උමා ඇල ව්‍යාපාරයේ වගාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා බැරැක්ප්ලේන් වැවෙහි ජලය, බෝඹුරු ඇල්ල ජලාශය වෙත නිකුත් කිරීම සිදු කරයි. බැරැක්ප්ලේන් වැව මගින් හා පෝෂක ඇලෙහි ජලය උපයෝගී කර ගනිමින් තවත් අක්කර 250 ක පමණ එළවළු වගාව සිදු කරයි.

බෝඹුරුඇල්ල ජලාශය පසු කරන මෙම ජල මාර්ගය තවත් එක් මනස්කාන්ත දියඇල්ලක් නිර්මාණය කරයි. එය බෝඹුරු ඇල්ලයි. නුවරඑළියට පැමිණෙන සංචාරකයන්ගේ තවත් එක් නැරඹුම් ස්ථානයක් ලෙස බෝඹුරුඇල්ල සඳහන් කල හැකිය. බෝඹුරුඇල්ල දිය ඇල්ලෙන් අනතුරුව ඌව පරණගම ජනතාවට පානීය ජලය වශයෙන් දිනකට ඝණ මීටර් 3000 ක් ප්‍රමාණයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් ලබා ගනී. බැරැක්ප්ලේන් වැව, අන්තර් පළාත් ගංභාවක පිහිටා ඇති නිසා බෝඹුරුඇල පෝෂිත ඇල සහ බැරැක්ප්ලේන් වැවේ ජල පාලනය සහ නඩත්තු කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

අභියෝග හා ගැටලු

මේ වන විට මෙම ජල මාර්ගය පාදක කර ගනිමින් විශාල අභියෝග රැසක් ඇතිවී ඇත. එනම්,

- ජල මාර්ග වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම් ඉහල යාම.
  මෙම ජල මාර්ගය ආරම්භයත් සමඟ ජනාකීර්ණ ප්‍රදේශ හරහා ගමන් කරන අතර ජල මාර්ගය දෙපස ජනතාව විසින් ජලයට අපද්‍රව්‍ය බැහැර කිරීම විශාල ගැටලු සහගත තත්ත්වයක් බවට පත්ව ඇත. එහිදී ප්ලාස්ටික් ඇතුළු ඝණ අපද්‍රව්‍ය ජල මාර්ගය ඔස්සේ ගලාවිත් බැරැක්ප්ලේන් වැව තුල ඒකරාශී වීම දක්නට ලැබෙන අතර එමගින් ජල මාර්ග අවහිර වීමත් ඒවා ඉවත් කිරීම වෙනුවෙන් වැඩි පරිශ්‍රමයක් මෙන්ම පිරිවැයක්ද දැරීමට සිදුවේ.
  ජල මාර්ගය ආසන්නය දක්වාම ජනතාව පදිංචි වී සිටින අතර ඔවුන් විසින් ඍජුවම වැවට හා පෝෂක ඇළ මාර්ගයට මළ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ජලයේ පිරිසිදුභාවය රැකගැනීමේ ගැටලු සහගත තත්ත්වයක් උද්ගතව ඇත.

- ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම.
  නුවරඑළිය ප්‍රදේශය තුල ඉඩම් සඳහා පවතින අධික ඉල්ලුම හේතු කොටගෙන ඉඩම්වල අගය වැඩිවීම හේතුවෙන් රක්ෂිත ඉඩම් ඇතුළුව රජයේ ඉඩම් ආරක්ෂා කර ගැනීමේ ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දී ඇති අතර පාරිසරික වශයෙන් සංවේදී ස්ථාන පවා ඇතැම් පාර්ශවයන්ගේ ගොදුරු බවට පත්ව ඇත.

විශේෂයෙන් බැරැක්ප්ලේන් වැවෙහි වැව් පතුල තුල පිරිසක් විසින් අනවසරයෙන් වගා කටයුතු කරමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන වලට විරුද්ධව නඩු පවරමින් මේ වනවිට කටයුතු කරමින් සිටී.

- අධික වර්ෂාවත් සමඟ ගංවතුර තත්ත්වයන් ඇතිවීම
  ප්‍රදේශයට ඇතිවන අධික වර්ෂාවත් සමඟ හාවාඑළිය ප්‍රදේශය ගංවතුරට ලක්වන අතර එමගින් එම ප්‍රදේශය තුල පවතින නිවාස මෙන්ම ව්‍යාපාරික ස්ථාන රැසක්ද පීඩාවට ලක් වේ.
  මේ සඳහා ජල මාර්ගයන් අවහිර කිරීම මෙන්ම බැරැක්ප්ලේන් වැව තුල අනවසර අල්ලා ගැනීම් හේතුවෙන් වැවෙහි ජලය පැතිරෙන සීමාව අඩුවීමත් හේතුවී ඇත.

<u>පාර්ශවකරුවන්ගේ හවුල්කාරිත්වය</u>

බැරැක්ප්ලේන් වැව පාරිසරික හා සංචාරක ආකර්ෂණයෙන් ඉහල ස්ථානයක් බවට පත් කිරීමේ අවශ්‍යතාවය පවතින අතර ඒ වෙනුවෙන් ඊට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් වශයෙන් අදාල රාජ්‍ය ආයතනයන්හී සක්‍රීය දායකත්වය අත්‍යාවශ්‍ය බවට මූලිකව හඳුනාගන්නා ලදී. ඒ අනුව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතිත්වයෙන් හා වාරිමාර්ග අධ්‍යක්ෂ (මහනුවර) ලේකම් වශයෙන් කටයුතු කරමින් "බැරැක්ප්ලේන් වැව හා වැව ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීමේ කමිටුව" ස්ථාපිත කරන ලදි.

එහි අනෙකුත් සමගාමී ආයතන ලෙස නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නුවරඑළිය මහ නගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, නුවරඑළිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ කාර්යාලය, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, ශ්‍රී ලංකා පොලීසිය යන ආයතනවල සහභාගීත්වය හා දායකත්වය ලබා ගන්නා ලදි. එහිදී එක් එක් ආයතනවලට අදාල කාර්යයන් හඳුනා ගනිමින් ඒවායේ තම වගකීම් ඉටු කිරීම හා එහි ප්‍රගතිය කමිටු රැස්වීම්වල සාකච්ඡා කිරීම සිදු කරනු ලබයි.

කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් අදාල ප්‍රදේශයතුල සිදු කරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවන් මගින් ජලය අපවිත්‍ර කිරීම් සිදුවන හඳුනාගෙන ඇති ස්ථාන ඊට අදාල පාර්ශවයන් දැනුවත් කරන ලදී. එමෙන්ම මේ වනවිටත් එලෙස ජලයට අපද්‍රව්‍ය එක් කරනු ලබන පාර්ශවයන් හඳුනාගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. ජලය දූෂණයට ප්‍රධාන වශයෙන් බලපා ඇති මලාපවහන පද්ධතියක් නොමැති වීමට විසඳුමක් ලෙස මේ වන විට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මැදිහත් වීමෙන් අපජල කළමනාකරණ පද්ධති ව්‍යාපෘතියක් පිහිටුවීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරමින් පවතී.
ඉහත කමිටු සාමාජිකයන්ගේ මැදිහත්වීම හේතුවෙන් මේ වන විට බැරැක්ප්ලේන් වැව වටා මළ අපද්‍රව්‍ය බැහැර කිරීම් වළක්වාගැනීමට හැකියාව ලැබී ඇතත් පෝෂක ඇලට මළ අපද්‍රව්‍ය බැහැර කිරීම් සම්පූර්ණයෙන් නැවැත්වීමට නොහැකි වී ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී බැරැක්ප්ලේන් වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර මේ වන විට එහි සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී. එම ප්‍රතිසංස්කරණ වලින් පසු වැවෙහි ධාරිතාවය අක්කර අඩි 68 සිට 101 දක්වා වර්ධනය වේ. වැවෙහි ජලය පැතිරෙන ප්‍රදේශය වැඩිවීම තුලින් මේ වන විට පවතින ගංවතුර තත්ත්වයන් පාලනය කර ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

විශේෂයෙන් බැරැක්ප්ලේන් වැව මැදි කරගත් සංවේදී පාරිසරික කලාපය තුල ලවර්ස්ලීප් දිය ඇල්ල, බැරැක්ප්ලේන් වැව, බෝඹුරුඇල්ල වැව හා බෝඹුරුඇල්ල දියඇල්ල මූලික කර ගනිමින් සංචාරක කලාපයක් බිහි කිරීමේ හැකියාව ඇති අතර එමගින් දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය ලබා ගනිමින් පාරිසරික සංචාරක කර්මාන්තය (Eco- Tourism) හඳුන්වා දිය හැකිය. එමගින් ප්‍රදේශයේ ජනතාවට මෙන්ම රටේ ආර්ථිකයටද යම් සහනයක් වනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ : Project Proposal for Restoration of BARRACK PLANE TANK In Nuwara Eliya (June 2019)
සැකසුම: ටී.ජී. ප්‍රියන්ත විජේසිරි, සංවර්ධන නිලධාරී, ප්‍රා.වා.ඉ. කාර්යාලය, නුවරඑළිය

ජලය හා බැඳුණු ජලජ ශාක හා සත්ත්ව ප්‍රජාව හා පරිසර පද්ධති

"ජල සම්පත මානව අයිතිවාසිකමක්. පිරිසිදු ජලය දෙවැනි වන්නේ මවුකිරට පමණි. ජලය දිවියේ ජීවයයි." එසේම ජලය නොමැතිව ජීවයක් ගැන කතා කිරීම නිෂ්ඵලය. අප ජීවත්වන පෘථිවියේ ජීවය මුලින්ම ඇතිවූයේ ද ජලය තුළයි. බොහෝ ජීවීන් තම තමන්ගේ කුමන හෝ අවස්ථාවක් ජලයේ ගත කරනු ලබයි. මිනිසා පවා තම කළල අවස්ථාව ගත කරන්නේ ජලජ පරිසරයක් තුළයි. මුල් ම මිනිස් ශිෂ්ටාචාරය වන මෙසපොතේමියානු ශිෂ්ටාචාරය, යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා ආශ්‍රිතව බිහිවූවා සේම ලංකාවේ ද මුල්ම රාජධානිය වන අනුරාධපුර රාජධානිය බිහිවූයේ ද මල්වතු ඔය ආශ්‍රිතවය. පෘථිවියේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 71% ක් පමණ ජලය වේ. ඒ අනුව බලන කල ගොඩබිම ජීවීන්ට වඩා විශාල ප්‍රමාණයක් ජලජ ජීවීන් ජීවත් වේ. මින් වැඩිම ප්‍රමාණයක් ජීවත් වන්නේ මුහුද තුලය. ජලජ පැළෑටි හා ජලජ ශාක ද පරිසර පද්ධතියේ ජෛව විවිධත්වයේ පැවැත්මට විශාල දායකත්වයක් ලබාදේ.

ජලජ පැළෑටි වැඩෙන පරිසරය අනුව පාවෙන ශාක (ජල පෘෂ්ඨය මත ජීවත්වන ශාක), නිමග්න ශාක (ශාක උපස්තරයට මුල් මගින් සවි වී පවතී), අර්ධ නිමග්න ශාක ලෙස ද (ශාකයෙහි ප්‍රභාසංස්ලේෂණය කරන සමහර කොටස් ජලයෙන් පිටතට නෙරා වායුගෝලයට නිරාවරණය වී ඇත.) ලෙස වර්ග කරනු ලබයි. සැල්විනියා සහ අයිචෝනරියා පාවෙන ශාක වලටත්, හයිඩ්‍රිල්ලා නිමග්න ශාක වලටත්, නිම්ෆේසා අර්ධ නිමග්න ශාක වලටත් උදාහරණ වේ.

සාගරය පිළිබඳව අවධානය යොමු කළහොත් එහි වෙසෙන ජීවීන් විවිධාකාරය. එනම් මුහුදු පැළෑටි වර්ග, මුහුදු මත්ස්‍යයින් හා මුහුදු සත්ත්වයන් ඒ අතර වේ. මුහුදු බල්ලා, මුහුදු සිංහයා, මුහුදු අශ්වයා, පෙන්ගුවින් වැනි සත්වයින්ද මුහුදේ ගල්මත බැදී ජීවත්වන ජීවින් ලෙස ඉකිරි, කවඩි, මිරිස්ස, මැට්ටි, බෙල්ලන් ද කැස්බෑවන් ද හඳුන්වාදිය හැක. මුහුදු ජීවීන් යටතට ගැනෙන ජලජ පැළෑටි ලෙස පාසි, ගල්මල්, ඇල්ගී ද වේ. මේවා ලංකාවේ ගාල්ල, හික්කඩුව, බූස්ස, රත්ගම, යාපනය වැනි ප්‍රදේශවල වෙරළ ආශ්‍රිත මුහුදේ දක්නට ලැබේ.

මුහුදු පැළෑටි වගාව විශාල මුදල් උපයන මාර්ගයකි. යාපනය, කිලිනොච්චිය, කල්පිටිය යන ප්‍රදේශවල මුහුදු පැළෑටි වියළා අපනයනයෙන් විශාල ආදායම් ප්‍රමාණයක් උපයාගනී.

මිනිස් ආහාර නිෂ්පාදන ලෙස මුහුදු ඇල්ගී විශාල කාර්යභාරයක් සිදු කරනු ලබයි. මුහුදු ඇල්ගී දුඹුරු හා රතු ඇල්ගී ලෙස වර්ග කරනු ලබන අතර ආර්ථිකමය වශයෙන් යොදා ගන්නේ විශේෂ කිහිපයක් පමණි.

මුහුදු ඇල්ගී, සත්ත්ව හා මිනිස් ආහාර, කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සඳහා ද මුහුදු ඇල්ගී වලින් ලබාගන්නා කැරජීනැන් අයිස්ක්‍රීම් සෑදීමට ද පොහොර නිෂ්පාදනයට ද මත්ස්‍යයින්ට හා සමහර ශාක භක්ෂක ජලජ ජීවින්ට ආහාර ලෙස ජීව ඉන්ධන සෑදීමට ද (මීතේන්) කර්ජිනන් යනුවෙන් හඳුන්වනු ලබන මුහුදු පැළෑටිය රූපලාවන්‍ය නිෂ්පාදනය, සුරතල් මත්ස්‍ය ආහාර, ඖෂධ හා දන්තාලේප සඳහා විශාල ලෙස යොදා ගනී.

ජලය ආශ්‍රිත පරිසරයත් එහි වෙසෙන ජෛව ප්‍රජාවත් එක් ව සෑදුම් ලත් පරිසර පද්ධතිය ජලජ පරිසර පද්ධතියයි. එම පරිසර පද්ධතිය තුළ ජීවි හා අජීව සංරචක අතර අන්තර් ක්‍රියා සිදුවේ.

ජලාශ්‍රිත ස්වභාවික පරිසර පද්ධති මිරිදිය ආශ්‍රිත, කරදිය ආශ්‍රිත හා කිවුල්දිය ආශ්‍රිත පරිසර පද්ධති ලෙස කොටස් 03 කට වර්ග කළ හැක. ගංගා හා විල්ලු මිරිදිය ආශ්‍රිත පරිසර පද්ධතියට ද කොරල්පර, ගල්පර කරදිය ආශ්‍රිත පරිසර පද්ධතියට ද කඩොලාන හා ලවණ වගුරු කිවුල්දිය ආශ්‍රිත පරිසර පද්ධතියට ද අයත් වේ.

කොරල්පර ආශ්‍රිත පරිසර පද්ධති

සාගරය තුළ පිහිටි පරිසර පද්ධති අතර ආකර්ශණීය හා ජෛව විවිධත්වයක් සහිත පරිසර පද්ධතියක් ලෙස කොරල්පර හැඳින්විය හැක. කොරල්පර විශාල ජෛව ප්‍රජාවකින් සමන්විතය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයහි දී සුවිශේෂි ස්ථානයක් කොරල්පර ආශ්‍රිත පරිසර පද්ධතියට අයත් වේ. ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත වීම, ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට, වෙරළ

බාදනය වැළැක්වීමට, ස්වභාව සෞන්දර්ය, විවිධ පර්යේෂණ හා අධ්‍යයන කටයුතු යනාදි බොහොමයක් ආර්ථික සංවර්ධිත කටයුතු කොරල්පර වැදගත් වේ.

<u>කඩොලාන පරිසර පද්ධති</u>

කිවුල්දිය ආශ්‍රිත පරිසරයේ වැඩෙන ජලජ ශාක අතුරෙන් කඩොලාන වලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ලෝකය පුරාවට කඩොලාන විශේෂ 54 ක් පමණ වාර්තා වන අතර ඉන් විශේෂ 21 ක් පමණ ලංකාව තුළ හමුවේ.

<u>කඩොලාන වල වැදගත්කම</u>

වෙරළ බාදනයෙන් ආරක්ෂා කිරීම, කලපු හා ගංමෝය වල සිදුවන සෝදා පාළුව වැළැක්වීම, ගංහා හා ඉවුරු සංරක්ෂණය, වෙරළබඩ ප්‍රදේශවල වැලි කඳු ස්ථාපිත වීමට ඉඩ සැලැස්වීම, මසුන් හා වෙනත් ජලජ ජීවීන්ගේ ප්‍රජනනයට හා වර්ධනයට සුදුසු උපස්ථරයක් සැකසීම, ධීවර යාත්‍රා නැවැත්වීමට සුදුසු පරිසරයක් වීම, පක්ෂීන්ට හා මසුන්ට ආහාර සැපයීම හා වාසස්ථානයක් ලෙස මෙන්ම ප්‍රජනනයට සුදුසු ලෙස පරිසරය සැකසීම හා දැව හා දර සඳහා භාවිතා කිරීම වැනි විශාල කාර්යභාරයක් කඩොලාන පරිසර පද්ධතියෙන් සිදු කරනු ලබයි.

ගිංපොල් ද කිරල ශාකය ද කැරම් කොකු ද කිවුල්දිය ආශ්‍රිතව වැඩේ. ගංවතුර හා ගංඉවුර බාදනයේ දී කඩොලාන ශාකය සේම සුවිශේෂි කාර්යභාරයක් ගිංපොල් වලින් ද ඉෂ්ට කරයි.

<u>කිරුළ හිමි කිරල</u>


කිරල වගුරු බිම්වල සැදෙන අතර රසවත් පළතුරක් සේම රසවත් පානයකි. විශේෂයෙන් දකුණු පළාතේ සංචාරක කර්මාන්තයෙන් ආර්ථික වාසි උපයාගන්නා පළතුරකි.

කැරම් කොකු/ බැරකොකු


මේවාද මිරිදිය සහිත වගුරු බිමෙහි සැදෙන මිනිස් ආහාරයට ගනු ලබන විශේෂිත වූ ශාක වර්ගයකි. උෂ්ණ ගුණ ඇති හුරුල්ලන්, බලයන් වැනි ආහාර පිසීමේ දී ඒවායෙහි උෂ්ණය අඩු කරගැනීමට මේ බැරකොකු යොදාගනී. බැරකොකු තුළ විටමින් A හා C ද පොස්පරස් හා වෙනත් ඛණිජ ලවණ වර්ග බොහොමයකින් පොහොසත් කෙඳි බහුල ආහාරයකි. දළු, කොළ වගේම මුල් ද දේශීය වෛද්‍ය ක්‍රමය තුල ප්‍රතිකාර සඳහා යොදා ගනී. තවද කාටිලේජ වර්ධනයට ද ඉතා ම ගුණදායකය.

විල්ලු

මිරිදිය ආශ්‍රිත බොහෝ සුන්දර ජීවින් හා ශාක වලට අනගිභවනීය තෝතැන්නක් වන විල්ලු පරිසර පද්ධතිය ගඟ පිටාර ගැලීමෙන් අනතුරුව ගංඟා ද්‍රෝණි දෙපස අවපාත තුළ ජලය රැස්වීමෙන් ඇතිවෙන අපූර්වතම පරිසරය තුළ විල්ලු තෘණ බිම් නිර්මාණය වේ. එම තෘණ බිම් භෞමික ජීවින්ට ක්ෂේම භූමියකි. ඇඹල කොකා, මලෙවියා, කණ කොකා, කහ හලපෙන්දා, කුළු මීමා, නරියා, තාරකා ඉබ්බා, හුඹස් හූනා වැනි සතුන් මෙහි ජීවත් වේ.

ඉහළ ජෛව විවිධත්වයකින් අනූන විල්ලු පරිසරය, ඒ අවට වාසය කරන්නා වූ ජනතාව සඳහා අමිල සේවයක් සපයනු ලැබේ. විල්ලු ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇති කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය ජලය විල්ලු විසින් සපයනු ලැබේ. එසේ ම සත්ත්ව පාලනය සඳහා එනම් කිරි ගවයන් සඳහා, එළුවන් සඳහා අවශ්‍ය තෘණ සහ ජලය විල්ලු මගින් සපයනු ලැබේ. තවද මිරිදිය කර්මාන්තය, වෙවැල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය සම්පත් මේ තුළින් සපයනු ලැබේ. තෙත් බිම්වල වැඩෙන ලුණුවිල ශාකය ලොකු පොඩි සැමට මහගු ඖෂධයකි. සමහර විල්ලු ගඩොල්,වැලි ගොඩ දැමීම යන ක්‍රියාවන් දක්නට ලැබේ. එමනිසා විල්ලු පරිසර පද්ධතියේ අඩපණ වීමක් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ පොළොන්නරු දිස්ත්‍රික්කය තුළ හඳපාන්විල, බැඳියාවල, කරපොල, මුතුගල, කටුවන්විල, මනම්පිටිය යනාදි ප්‍රධාන විල්ලු 06 ක් දැකිය හැක. විල්ලු පරිසරයක දක්නට ලැබෙන ජලජ ශාක අතර වටැස්ස, වෙල් කොහිල, කෙකටිය, තිඹිරි මූලික වේ.

මිරිදියෙහි වගා කරන ආහාරමය ජලජ ශාක ලෙස කෙකටිය, ලුණුවිල, කොහිල, ඇරෝහෙඩ්, වෙල්අල යනාදිය සුවිශේෂී වේ.

වගුරු බිම් ගොඩ කර නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම, ජල විදුලි බලාගාර ඉදිකිරීම, විදේශීය ආනයනික ආක්‍රමණික ශාක හා සත්ත්වයින් නිසා සුන්දරවූත් අපූර්වවූත් අනගිභවනීය ස්වභාවික ජලජ පරිසර පද්ධති විනාශ වේ. ස්වභාවික ජලජ පරිසර පද්ධති විනාශවී යාම නිසා මිනිසාට සේම සත්තවයින්ට ද ආහාර හිගයක් ඇති වේ. ජලජ ශාක විනාශය නිසා සත්ත්ව වාසස්ථාන අහිමිවීම ද එනිසාම ප්‍රජනන කාර්යයන් අඩාල වීමෙන් ජීවීන් වඳවී යාම නිසා ස්වභාවදහමේ අපූර්ව දායාදයක් වූ සුන්දර ජෛව විවිධත්වය විනාශ වේ. ජීවයේ පැවැත්ම උදෙසා ජලජ පරිසර පද්ධති ආරක්ෂා කිරීම අප සතු යුතුකමක් සේම වගකීමකි. ජලජ පරිසර පද්ධතිවල ආරක්ෂාව උදෙසා යහපත් වූ මිනිස් ආකල්ප ඇති කිරීම සේම නීතිමය පැතිකඩ ගැන ද අවධානය යොමු කිරීම කාලෝචිතය.

සැකසුම - එන්.නිලූෂා මැන්දිස්

සංවර්ධන නිලධාරී (ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, බදුල්ල)

ඉර මල් රේණු දරා පෙති මත

නැහෙන්නට වෙර දරන පත් වල

දෙපෙත්තෙන් දැනී සුබ නිමිති හෙට දවස

පෙර ගමන් ඇදෙයි සිනා සී දිය රළ...

වියළි ගම්බිම් දනව් පිරිපත

සාර ගොවිබිම් මැවෙන මහිමය

දැල ගංදිය මතින් පොබයන

සාර අස්වනු නෙළන අරුමය...

රුහුණු- මායා- පිහිටි යා කළ

වෙල්ලස්ස සරු බිමක උරුමය

ගලා යයි දැක තුටින මෙහෙවර

සිහිල් දිය රැළි සිනා නඟමින...

කෙඩැරුණු මිහි මතින ගිනියම

ඉපල් වුණු අතු දරා තනියම

විඩාපත් තුරු මුදුන් වැළපෙන

යදී වැහි දිය දෝත සනහන...

තිලංකා රුවින්දනී වෙත්තසිංහ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

චිරං ජයතු වාරිමග හට විකුම්, අබිමන් ඉදිරියේ.......

සතා සිවුපා මිනිස් උගතා සොබාදම් මවගේ ඇකේ
පෙරළි කරලා නොගෙන සැමදා සිටිමු නිතිදා සමඟියේ
වැඟි පිරිත් බලයක්ම වී හෙට විඩාබර නෙත් මානයේ
සතුටු කඳුළයි මේ ගලන්නේ වාන්දොර හැරියා ලෙසේ

රෝහිණී නදියෙත් එදා, දිය කඳට බැන්දේ මංමුලා
බුදු නෙතේ මෙත් සිත යොමා, වෛරයේ ගිනි දුරු කළා
බෙදා ගනු වස්, බදා ගැනුමම නොවන බව පෙන්වා වදාරා
බුදු පියාණනි වඩිනු මැනවී, පසක් කරනුව එය මෙදා

මුරගලේ නාරජ දයාබර, ජලය සුරකී වැව් ඉමේ
කෙතට වඩිනා ගොවි රජාටත් සතුට,සැනසුම ගෙන දෙතේ
හිතේ සමඟිය වැඩිවෙලා අද රටේ බත් පත ඉදිරියේ
වාරිමගමයි දිරිය දෙන්නී සැමට නොදෙවනි මිහිමතේ

පොරණ සිංහල රාජ වංශය එදා දිවියම පුද කළේ

යුගෙන් යුග වැව් අමුණු තනවා දෙරණ මත බුහුමන් කළේ

අතීතයෙ සිට පාන පෙළහර වාරිමග අද සිව් හෙළේ

චිරං ජයතු වාරිමග හට විකුම්, අබිමන් ඉදිරියේ.......

නිර්මාණය:- එම්. ඒ. ටී. ආර්. දසනායක

ඉංජිනේරු සහකාර (ජල කළමනාකරණ අංශය)

உலக நீர் தினமும் அதன் சமூகப் பாங்கும்

இன்று உலகளாவிய ரீதியில் கொண்டாடப்பட்டு வருகின்ற பல்வேறு தினங்களில் உலக நீர் தினமும் ஒன்றாக அமைகின்றது. ஆண்டுதோறும் **மாரச் மாதம் 22 ஆம் திகதி** கொண்டாடப்படுகின்ற இந்த நீர் தினமானது ஏனைய உலகளாவிய ரீதியில் கொண்டாடப்பட்டு வருகின்ற தினங்களில் இருந்து அதிமுக்கியத்துவம் பெற்று சற்று வேறுபடுகின்றது. ஐக்கிய நாடுகள் சபையின் உத்தியோக பூர்வ அங்கீகாரத்துடன் மார்ச் 22 என்பது உலக நீர் தினம் எனத் தீர்மானிக்கப்பட்டு உலகெங்கும் கொண்டாடப்பட்டு வருகிறது என்பதை யாவரும் அறிந்ததே.

அருகி வருகின்ற நீர்வளத்தின் சகல திட்டங்களையும் அதன் பராமரிப்பு நிர்வாகத்தை விருத்தி செய்து நீர்வளப் பாதுகாப்பை நன்கு வலுப்படுத்தி நாளாந்தம் பெரும் சவாலாக அமைந்து வருகின்ற நீர்ப்பற்றாக்குறைப் பிரச்சினையை தீர்ப்பதே உலக நீர் தினம் கொண்டாடப்படுவதன் பிரதான நோக்கம் ஆகும். அதுமட்டுமன்றி, நாடுகளின் புவியியல் அமைப்பிற்கு தக்கவாறு அந்தந்த நாட்டின் நீர்வளப் பாதுகாப்பு பற்றி மக்களுக்கு விழிப்புணர்வு ஏற்படுத்துதலும் இந்த நீர் தினத்தின் ஒரு அம்சம் ஆகும். மற்றும் ஒரு நாட்டின் எதிர்காலப் பிரஜைகளாக சமூகத்தின் பல சவால்களை எதிர்கொள்ளக் காத்திருக்கும் மாணவ சமூகத்திற்கும் அவரவரது நாட்டின் நீர்வளப் பாதுகாப்புப் பற்றி விழிப்புணர்வு அளிப்பதும் இந்த உலக நீர் தினத்தின் இன்னொரு சிறப்பம்சம் ஆகும். இன்னும் சொல்லப்போனால், நீரின்றி அமையாதது உலகு, நீர்வளங்கள் மிக விரைவாக அருகிச் செல்கின்றன மற்றும் சூழல் பிரச்சினைகளில் முன்னோடியாகத் திகழ்வது இந்த நீர்ப்பற்றாக்குறை எனும் தாற்பரியங்களைத் தாங்கி நிற்கிறது இந்த நீர் தினம். நீரில்லாத வாழ்க்கையை எங்களால் எண்ணிப் பார்க்கவே முடியாத அளவுக்கு நீர் எமது வாழ்வின் ஒரு பிரதான அங்கமாகத் திகழ்கின்றது.

1992 ஆம் ஆண்டு பிரேஸிலில் ரியோடி ஜனய்ரா நகரில் நடைபெற்ற ஐக்கிய நாடுகள் சபை **சூழலும் அபிவிருத்தியும்** எனும் மாநாட்டின் 21 ம் நூற்றாண்டுக்கான நிகழ்ச்சித் திட்டத்தில் இந்த நீர் தினம் ஆண்டு தோறும் மார்ச் மாதம் 22 ம் திகதி கொண்டாடப்பட வேண்டும் என ஏகமனதாகத் தீர்மானிக்கப்பட்டது. இதன் அடிப்படையில் 1993 ஆம் ஆண்டு மாரச் மாதம் 22ம் திகதி முதன் முதலான உலக நீர் தினம் கொண்டாடப்பட்டது. அதன்பின்னர் இன்று வரைக்கும் ஆண்டு தோறும் மார்ச் மாதம் 22ம் திகதி உலகெங்கிலும் நீர் தினம் ஒவ்வொரு கருப்பொருளை வலியுறுத்திக் கொண்டாடப்பட்டு வருகின்றது.

1993 இல் முதன்முதலாக நீர் தினம் உலகளாவிய ரீதியில் ஆரம்பித்து வைக்கப்பட்டது. நீர்வளங்களின் பாதுகாப்பு பற்றிய விழிப்புணர்வை மனித சமூகத்திற்கு வழங்குதல் என்பதே இதன் பிரதான நோக்கமாக இருந்தபோதிலும் அந்த ஆண்டில் விசேடமான கருப்பொருள் அல்லது எண்ணக் கருவோ அமைந்திருக்கவில்லை. எனினும் 1994 ஆம் ஆண்டு சர்வதேச ரீதியில் முதன்முறையாக ‘‘நீர்வளங்களைப் பராமரிப்பது எம் எல்லோரதும் கடப்பாடு’’ எனும் கருப் பொருளில் உலக நீர் தினம் உலகெங்கும் கொண்டாடப்பட்டது. எமது அன்றாட நடவடிக்கைகளின்போது எண்ணெய், பூச்சிகொல்லிகள், உரங்கள் மற்றும் வண்டல் மண் ஆகியவை நீரூடகங்களை எப்படியோ சென்றடைந்து விடுகின்றன. எமது நீர்வளங்களைச் சுத்தமாக வைத்திருப்பதையும் மற்றும் நாம் சுற்றுப் புறத்தில் போதியளவு நீர் இருப்பதை உறுதி செய்வதையும் அனைவரும் ஆதரவளிக்க வேண்டும். அதாவது எமது வீட்டைச் சுற்றியுள்ள நீர்வளங்களை மாசுக்களிலிருந்து பாதுகாத்தல் எனப் பொருள்படும்.



1995 ஆம் ஆண்டு உலக நீர் தினத்தின் கருப்பொருள் ‘‘மகளிரும் நீரும்’’ என்பதாக அமைந்தது. நீர் சேகரிக்கும் கடமையில் முக்கிய அங்கம் வகிப்பவர்கள் பெண்களாக அமைவதால் நீரால் பரவும் நோய்களுக்கு முதலில் ஆளாகுபவர்கள் பெண்களே. இது பெண்களின் ஆரோக்கியம் மற்றும் இனப்பெருக்க ஆரோக்கியத்தை நேரடியாகப் பாதிக்கின்றது. அதுமட்டுமில்லாமல், அதிக குழந்தைகள் இறந்த நிலையிலே பிரசவிக்கின்றன அல்லது குறைபாடுகளுடன் பிறக்கின்றன. பாதுகாப்பான நீர் மற்றும் சுகாதார சேவை (WASH) இன்றி பெண்கள் மற்றும் சிறுமிகள் துஸ்பிரயோகத்துக்கும், தாக்குதலுக்கும் மற்றும் உடல்நலக் குறைவுக்கும் ஆளாகின்றனர். இது அவர்களின் கல்வி, தொழில் மற்றும் கண்ணியத்தை முற்றாகப் பாதிக்கின்றது. வீடு, பாடசாலை, வேலைத்தளம் மற்றும் பொது இடங்களில் மேம்படுத்தப்படும் நீர் மற்றும் சுகாதார சேவைகள் (WASH) பாலின சமத்துவத்தைப் பிரதிபலிக்கின்றன. சேவைகள் அனைத்தும் அவர்களின் குறிப்பிட்ட தேவைக்கு அமையும் முகமாக பெண்களும் சிறுமிகளும் தீர்வுகளை வடிவமைத்துச் செயற்படுத்துவதில் முக்கிய பங்கு வகிக்க வேண்டும்.

நீர் மற்றும் துப்புரவு சேவைகள் இன்றிய சுற்றுப்புறங்களில் உள்ள சுகாதாரமற்ற நிலைப்பாடுகள் வாந்திபேதி போன்ற நோய்க்கிளர்ச்சியின் தொடர்ச்சியான அச்சுறுத்தலை ஏற்படுத்துகின்றன. இது ஏழைச் சமூகங்களை பேரழிவுக்கு உட்படுத்தி நகரத்துக்கும் அதற்கு அப்பாலும் பரவுகின்றது. இதனால் சேவை காணாத நகர்ப்புறச் சூழல்கள் இலகுவில் அதிர்ச்சிக்கு ஆளாகின்றன. இந்நிலையை மையப்படுத்தி 1996 ஆம் ஆண்டு உலக நீர் தினம் ‘‘தாகம் கொண்ட நகரங்களுக்கான நீர்’’ எனும் கருப்பொருள் கொண்டு அமையப்பெற்றது.

